ගලිගමුව ප්‍රාදේශිය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය .

----------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 14 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගලිගමුව, බටුවත්ත හා පිටගල්දෙනිය පුස්තකාලවල පොත් 154 ක ඌනතාවයකට අදාල රු. 17,090 ක වටිනාකම, පුස්තකාල පොත් ගිණුමට හා ප්‍රාග්ධන යෙදුමට අදායමින් දායක වීමේ ගිණුමට ගැලපීම් කර නොතිබුණි.

(ආ) 2012 හා 2013 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ පරිදි සමාලෝචිත වර්ෂයේදී ඉවත් කරන ලද රු. 256,626 ක් වූ ලී බඩු හා උපකරණ වටිනාකම, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට ගැලපීම් නොකර සමුච්චිත අරමුදලට හර කිරීම නිසා දායක වීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉඩම් කට්ටි සැළසුම් අනුමත කිරීමේදී සභාවට ලබා ගන්නා ලද පර්චස් 44 කින් යුතු බටුවත්ත දික්හිදවත්ත ඉඩමේ වටිනාකම වූ රු.100,000 ක අගය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන අක්කර 09 රූඩ් 02 ½ කින් යුත් ඉඩම් කොටස් 09 ක වටිනාකම ගණනය කර ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සහා පුස්තකාල 03 ක් සඳහා ලද පරිත්‍යාග පොත් වටිනාකම වූ රු.107,182 ක් පරිත්‍යාග වශයෙන් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් වල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා ගෙවිය යුතුමුද්දර ගාස්තු කාර්ය මණ්ඩල දීමනා පිළිවෙලින් රු.33,825 ක් හා රු.48,625 ක් ණයහිමියන් යටතේ දක්වා නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.82,450 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) කාර්යාලයේ නිලධාරින් භාරයේ පැවති රු.109,280 ක්වූ වෙනත් උපකරණ වටිනාකම අනුචිතව සමුච්චිත අරමුදලට හර කිරීම නිසා වර්ෂයේ වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසදූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පුස්තකාල පොත් ශේෂය රු.2,695,352 ක් හා ලෙජර් ගිණුම් අනුව ශේෂය රු.2,758,710 ක් වූයෙන් වෙනස රු.63,358 ක් විය.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2014 වර්ෂය තුළදී ගෙවා තිබූ කර්මාන්ත අත්තිකාරම් රු. 200,000 ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී පියවීම් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු,704,444 ක් විය.

1.3.4 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම්. |
|---|---|
| (අ) 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනත | විනෝද බදු අයකිරිමේදි සභාව සම්මත කළ යෝජනාවක් විෂය භාර අමාත්‍යවරයා අනුමත කර ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව පමණක් විනෝද බදු අයකළහැකි වුවත්,2014 වර්ෂයේදී රු. 91, 750 කමුදලක්අයකිරීම සම්බන්ධයෙන් යථෝක්ත රෙගුලාසි අනුගමනය කර නොතිබුණි. |
| (ආ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | එක් එක් කාර්තුවට අදාල මුද්දර බදු මුදල, ඊලඟ මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කළයුතු වුවත් ,2010 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සේවක වැටුප් වලින් අයකළ යුතු රු.21,500 ක මුද්දර බදු 2015 දක්වා ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.396( ඇ) | මාස 06 ක කාලයක් ඉක්මවූ රු.53,840 කල් ඉකුත් චෙක්පත් 23 කට අදාලව යොමු ගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනොතිබුණි. |

| | |
|---|---|
| මු.රෙ.571 | එකතුව රු.596,846ක් වු කල් ඉකුත් වූ තැන්පත් ශේෂ 101ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,148,969ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,675,555 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,473,414ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු.6,473,414 ක වර්ධනයට ආදායම් විෂයයන් 05ක වැඩිවීම හා වියදම් විෂයයන් 04 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරිම | 2014 වර්ෂයේ බිල් කිරීම් | 2014.12.31 දිනට හිගය<br>වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් අයවිම | වර්ෂයේ බිල් කිරීම් වලින් හිහය | මුළු හිහය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| iවරිපනම් හා බදු | 521,859 | 333,329 | 2,385,000 | 2,065,510 | 188,530 | 319,490 | 508,019 |
| ii බදු කුලී | 7,500 | 2,250 | 3,566,000 | 1,685,594 | 5,250 | 1,880,405 | 1,885,655 |
| iiබලපත්‍ර ගාස්තු | 52,050 | 2,200 | 727,175 | 748,608 | 25,700 | (21,433) | 4,267 |
| Ivවෙනත් ආදායම් | - | - | 2,332,000 | 3,176,461 | - | (844,461) | (844,461) |

2014 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති හිග ආදායම් ශේෂයන් ගිණුම් වාර්තාවේ ඉදිරිපත්කර ඇති හිග ශේෂයන් සමග නොසැසදුණි.

2.3.2 වරිපනම් බදු

----------------

දීර්ඝ කාලයක සිට වරිපනම් බදු නොගෙවා පැහැර හැර ඇති බදුකරුවන් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (i) | උසාවි දඩ | 680,084 |
| (ii) | මුද්දර ගාස්තු | 9,310,211 |
| | | 9,990,295 |

2.3.4 බලපත්‍ර ගාස්තු

-----------------

2013 හා 2014 වර්ෂ සඳහා පරිසර බලපත්‍ර ලබාගත් ලී මෝල් 08 ක් ,වඩුමඩු 09 ක් ,ගෘහභාණ්ඩ නිෂ්පාදන ආයතන 02 ක් ,ගඩොල් පෝරණුවක් හා බ්ලොක් ගල් වැඩපලක් සඳහා බලපත්‍ර ගාස්තු වශයෙන් රු.22,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 මස්කඩ බදු

----------------

2014 වර්ෂය සඳහා කොටියාකුඹුර ගවමස් කඩය බදු දීමට අදාල ගිවිසුමේ අංක 3 කොන්දේසියට අනුව මාසික බදු මුදල හා ප්‍රමාද දඩ මුදල මාසයේ 15 දිනට පෙර නොගෙවන්නේ නම් ගිවිසුම අවලංගු කරන බවට දක්වා තිබුණි. එහෙත් 2014 අගෝස්තු මාසයේ සිට බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණ ද ගිවිසුම අවලංගු නොකර දෙසැම්බර් 31 දින දක්වාම ව්‍යාපාරය කරගෙන යාමට අවස්ථාව ලබාදීමෙන් රු.525,148 හිග මුදලක් අයකර ගැනීමට නොහැකිව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සබරගමු පළාත් සභාව මඟින් ප්‍රාදේශීය සභාවට ලබාදී තිබූ වාහන 10 ක් සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභිකයින් වෙත රු.221,428 ක් වටිනා කොඩිකණු 200 ක ප්‍රමාණයක් විධිමත් නිකුත් කිරීම් ක්‍රම වේදයකින් බැහැරව නිකුත් කර තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 17 දින සභාවට ලැබී තිබූ රු.531,428 ක් වටිනා කොඩිකණු 480 ක් අතරින් රු.34,321 ක් වටිනා කොඩිකණු 31 ක් සභාව සතුව නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

සභාවට අයත් බැංකු ගිණුමක රු.46,582 ක මුදල් ශේෂයක් 2013 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණි.

3.3 ආර්ථික නොවූ ගුදෙනු

2013 වර්ෂයේදී සභා පොල භූමියේ ගොඩනැගිලි නවීකරණය කිරීම වෙනුවෙන් රු.495,467 ක් වැයකර තිබුණ ද, එම ගොඩනැගිලි 2014 වර්ෂයේ දී කඩා ඉවත් කර තිබුණි.

3.4 අභ්‍යන්තර විගණනය

1988 මුල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5 (7) ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යාම සභාපතිවරයාගේ කාර්යයක් වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය